# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2025/19 - 2017 ජුනි මස 27 වැනි අඟහරුවාදා - 2017.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම (සංශෝධන) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ගොනු අංකය*: GAL/LAN/ACQUIS/A13 /19
*ඉඩම් අමාත්‍යාංශ අංකය*: 4-3/9/2013/WS/377

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙලිගල් කෝරළේ නැගෙනහිර සුළු කොට්ඨාසයේ, වේරගොඩ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද මූලික පිඹුර කැ 3545 හා 2017.05.30 දිනැති පිඹුර අනුව මුළු ප්‍රමාණය හෙක්ටයාර් 0.0569 ක් වූ ඉඩම් කොටස.

01. කැබලි අංක 01

ඉඩමේ නම: නාන්ගොඩහේන *නොහොත්* ගංගොඩහේන; හිමිකම් කියන අය: ආර්. එම්. ඩී. බී. රණතුංග, හත්නාගොඩ, බෙලිවත්ත, බෙලිගල; ප්‍රමාණය: හෙක්. 0.0569

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ජූලි මස 19 වැනි දින පෙ. ව. 10.00ට ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 ජූලි මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. ජී. එස්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලිගමුව.

2017 ජුනි මස 22 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 331


1A - G 25805 - 17 (2017/06)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.